# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශේෂ**

අංක 2105/22 - 2019 ජනවාරි මස 09 වැනි බදාදා - 2019.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරියේ නීතිය යටතේ සකස් කරන ලද කොළඹ නගර සංවර්ධන සැලැස්ම (සංශෝධන) -2008 සංශෝධනය කිරීම අනුමත කිරීමේ දැන්වීම**

මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය නීතියේ 8ඊ වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ රෙගුලාසි - 2008 (සංශෝධනය) වෙත ඇතුළත් කිරීමට නියමිත යෝජිත සංශෝධනය අනුමත කරන ලද බව, කලින් කලට සංශෝධිත 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය නීතියේ 8උ වගන්තිය යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මහජනතාව වෙත මෙයින් දැනුම් දෙමි.

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය නීතියේ 8ඌ වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර කොළඹ නගර සංවර්ධන සැලැස්මේ - 2008 (අනුමත කොළඹ නගර සංවර්ධන සැලැස්මේ - 1999 සංශෝධනයක් වන) සංශෝධනයේ 7.30 වගන්තියට අදාළ සංශෝධනය මෙයින් අනුමත කරමි.

01 කොළඹ සංවර්ධන සැලැස්මේ 2008 සංශෝධනයේ 7.30 වගන්තිය (අනුමත කොළඹ නගර සංවර්ධන සැලැස්මේ - 1999 සංශෝධනයක් වන) 3 වන පරිච්ඡේදයට ඉක්බිතිව ම නව පරිච්ඡේදයක් ඇතුළත් කිරීම මගින් පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"විශේෂ මූලික නේවාසික කලාපයේ සංවර්ධන කටයුතුවලදී මුලු මහල් සංඛ්‍යාව සහ අනෙකුත් නියාමන අවශ්‍යතාවන් නොසලකා යෝජිත සංවර්ධනයන් සඳහා උපරිම වශයෙන් වාහන ගාල් කිරීම පිණිස අතිරේක මහලක් සහ එක් මැදි මහලක් සඳහා අවසර ලබා දෙනු ලැබේ."

කොළඹ නගර සංවර්ධන සැලැස්ම (සංශෝධිත) - 2008, 7.30 වන වගන්තිය සංශෝධනය කිරීම.

පාඨලී චම්පික රණවක,
මහා නගර සහ බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2017 ජූලි මස 14 වැනි දින,

*සැ. යු. - මෙම රෙගුලාසිය 2017 ජූලි මස 14 වන දින සිට බලපැවැත්වේ.*

01 - 557


1A - PG 4349 — 92 (2019/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.